7. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුවට අවලංගු කිරීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟතාවය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟතාවයක් නොමැතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා '' ලාංකික '' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු අදහස් කරන අතර එවැන්නෙක් පාඨයට ඇතුලත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කමයුතු සඳහා යොදනු ලබන සෑම කම්කරු ශ්‍රේණියකටම සාධාරණ වූ ද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැන්ට බල පවත්වන සහ මින් මතු ක්‍රියාවට ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූ ද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධව ඔහුගේ පතපොත චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනෙකුත් ලිපිලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

8. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් පතක් මගින් මාතලේ දිසාපතිගෙන් ලබා ගත හැක.

සිරිල් ගමගේ,
මාතලේ දිසාපති.

10–901—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—බදුල්ල මහ රෝහල, බදුල්ල කොට්ඨාශ කිලිටි රෙදි සේදීම—1974

අංක 79—1973 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති ඉහත සඳහන් ටෙන්ඩර් දැන්වීමට ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව, 1973.11.09 වැනි දින පෙරවරු 10 ට කල් දමා ඇති බව සලකන්න.

ජේ. ප්‍රනාන්දු,
සෞඛ්‍ය සේවා අධිකාරි,
බදුල්ල.

9–884—73.10.26 දින 83 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා සංචාරක මණ්ඩලය

#### (පියන් රහිත) හිස් පීප්ප සැපයීමේ ටෙන්ඩර් කැඳවීම

මතු සඳහන් භාණ්ඩ සැපයීම සඳහා සීල් තැබූ කවරවල බහාලූ ටෙන්ඩර්පත්, 1973 නොවැම්බර් 2 වැනි සිකුරාදා දහවල් 12 වන තෙක්, කොළඹ 3, ගාලු මුවදොර මැද පාරේ, අංක 25 හි පිහිටි ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ඇත. මෙම කාර්යය සඳහා ඉහත කී ලිපිනයෙහි සඟයා ඇති විශේෂ පෙට්ටියෙහි ද, මේ ටෙන්ඩර්පත් පුද්ගලිකව තැන්පත් කිරීමට හැකිවේ.

(i) හොඳ තත්ත්වයකින් යුත්, ගැලුම් 20-25 ක ප්‍රමාණයක් දැරිය හැකි, ගේජ් 20 නොවැඩි ඝනකමක් සතු, අඩු 2 ක් සවිකර ඇති හිස් බාග පීප්ප අවශ්‍ය ප්‍රමාණය 150 කි.

(ii) හොඳ තත්වයකින් යුත් ගැලුම් 10-15 ක ප්‍රමාණයක් දැරිය හැකි අඩු දෙකක් සවි කරන ලද, හිස් පීප්ප සැපයීම ඝනකම ගේජ් 22 කට වැඩි නොවිය යුතුය. අවශ්‍ය ප්‍රමාණය 150 කි.

(iii) හිස් තාර පීප්ප බාග සැපයීම මේවායෙහි ද අඩු දෙකක් සවිකර තිබිය යුතුය. අවශ්‍ය ප්‍රමාණය 150 කි.

(iv) මෙම මණ්ඩලය විසින් සපයන හිස් තෙල් පීප්ප (ගැලුම් 45) 75 දෙකට, කපා අඩු දෙකක් සවිකිරීම.

2. සියලුම ටෙන්ඩර් පත්, " හිස් පීප්ප සැපයීම පිළිබඳ ටෙන්ඩර් පත් " යන වචන වම්පස ඉහළ කෙලවරේ සඳහන් කවරයක බහා සීල් තබා එවිය යුතුය. මෙම ටෙන්ඩර් පත් එක් භාණ්ඩ වර්ගයක්, හෝ සියල්ලම සඳහා එවිය හැකිවේ.

3. ටෙන්ඩර්පත් විවෘත කිරීම.—1973 නොවැම්බර් 2 වැනි සිකුරාදා පස්වරු 3.30 ට ලංකා සංචාරක මණ්ඩලයේ සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයේ දී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ නියෝජිතයිනට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටිය හැකිවේ.

4. සියලුම මිල ගණන්, ටෙන්ඩර්පත් කැඳවීම අවසන් වන දින යෙහි සිට සති 4 ක් ඉක්මවන තෙක් වලංගු විය යුතුය. මෙම ටෙන්ඩර්පත් වලින් කිසිවක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීම සහ කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමට, කිසිදු අවහිරයක් නොමැති වූ සම්පූර්ණ අයිතිය මණ්ඩලය සතුව පවතිනු ඇත.

5. මෙය පිළිබඳ අමතර විස්තර, අධ්‍යක්ෂ/ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිවේ.

නලින් අබේනායක,
වැඩබලන සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය.

1973 ඔක්තෝබර් 15 දින.
කොළඹ 3, ...
ගාලු මුවදොර මැද පාරේ අංක 25 පිහිටි
ලංකා සංචාරක මණ්ඩලයේ දීය.

9–892—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බලවේග පේෂකර්ම යන්ත්‍ර අමතර කොටස් සැපයීම සඳහා 1973.11.21 දින පෙරවරු 10 වන තෙක් දේශීය නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය: 3/1—(3/15).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973.10.16.

10–882—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්‍යාලය—බණ්ඩාරවෙල නගරය

මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමය යටතේ ධම්පාල මාවතේ ජෝඩු නිවාස දෙකක් සෑදීම සඳහා අනුපිටපතකින් යුතු, සිල් තබන ලද ටෙන්ඩර්පත්, 1973 නොවැම්බර් මස 3 වන දින පෙරවරු 10 දක්වා මවිසින් භාර ගනු ලැබේ.

රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා රු. 25 ක ටෙන්ඩර් පෝර්ම ගාස්තුවක් ගෙවීමෙන් රු. 30,000 ට හෝ ඊට වැඩි ලියාපදිංචියක් ඇති කොන්ත්‍රාත් කරුවන්ට, 1973 නොවැම්බර් මස 1 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දැනුම්දීමෙන් පසු, දින 10 ක් ඇතුළත ටෙන්ඩර් කරන ලද මුදලින් 5% ක මුදලක් ආරක්ෂිත ඇප වශයෙන් තැන්පත් කොට නියමිත ගිවිසුම් පත්‍ර අත්සන් කළ යුතුය.

කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විශේෂ කොමසාරිස් සතුය.

මේ පිළිබඳ වැඩිමනත් විස්තර කාර්‍යාලීය වේලාවන් තුළදී සභාවේ කර්මාන්ත අධිකාරීතැනගෙන් විමසා දැන ගත හැක.

ආර්. සෙන්ට්. එස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්.

විශේෂ කොමසාරිස් කාර්‍යාලය,
බණ්ඩාරවෙල,
1973. 10. 08.

10–86—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### මාතර කච්චේරිය

**මාතර දිස්ත්‍රික්කය තුල, කියාඩුව ඉලුප්පැල්ල පාර සහ මලිදූව—කොහුගොඩ පාර තැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

ඉහත සඳහන් වැඩ සඳහා (වාරිමාර්ග, මහාමාර්ග, අධ්‍යාපන වැනි) රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් සහ සමුපකාර කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සීල් තබා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුය.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ, 3 වැනි තට්ටුවේ, අංක 320 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. නො එසේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරෙහි "(වැඩයෙහි නම සඳහන් කරන්න) සඳහා වූ ටෙන්ඩර්" යයි ලියා 1973. 11. 02 වෙනි දින පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුය. එදින එම වේලාවේදී ම ටෙන්ඩර්පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ට ද එදින එම වේලාවේ දී පැමිණ සිටිය හැක.

5. 1973.10.30 වෙනි දින දහවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයෙහි ඉල්ලුම් නොකරන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයෙහි කරනු ලබන මැකීම්, කටුගෑම් හෝ පළුව කරන වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුය.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රු. 50 ක් මාතර දිසාපති කාර්යාලයෙහි තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ආදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ඔහුට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනිකුත් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

10. තෝරාගත් ටෙන්ඩර්කරු, නියම කරනු ලබන කාල සීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක (5%) මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාපති විසින් නියම කරනු ඇත. ලියාපදිංචි කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීම අනවශ්‍යය.

11. ප්‍රශ්න කිරීමෙන් තොරව, ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. රජයේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

| වැඩයේ නම | ලියා පදිංචිය |
|---|---|
| 1. කියාඩුව—ඉලුප්පැල්ල පාර | රු. 50,000 හෝ ඊට වැඩි |
| 2. මලිදූව—කොහුගොඩ පාර ... | රු. 45,000 හෝ ඊට වැඩි |

ඒ. ඩබ්ලිව්. ඩී. පෙරේරා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 ඔක්තෝබර් මස 02 වැනි දින,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

10–787—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට උණ කොට සැපයීම සඳහා ටෙන්ඩර්**

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට හොඳින් මෝරණ ලද අඩි 26 බැගින් දික්වූ කහඋණ කොට 1,000ක් සැපයීම හා ගෙනගොස් භාරදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973.11.15 වන දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයෙන් ලබාගන්නා ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි "කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට උණ කොට සැපයීම සඳහා ටෙන්ඩර්" කියා සඳහන් කළ යුතුයි.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 දින සිට 1974 දෙසැම්බර් මස 31වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවාඅධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. එසේ වුවත්, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, රත්නපුර සහ වවුනියා යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක්, ඉල්ලුම් පතට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට, ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවාසන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර පෝර්ම ලබා ගැනීමට කැමති සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැකිය. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වන තීරය බලන්න.

(i) **රෝගියකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.**

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 9 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිලට මුදල් ගෙවිය යුතුයි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වව්චරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය.

ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කර ගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩු කර ගනු ලැබේ.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, මාතර'' කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක්දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පෞද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කර ගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩර් තීරණය.**—ටෙන්ඩර් පත් තෝරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයෙහි ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛන යට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. **තැන්පත් මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරා ගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

5. 1973 නොවැම්බර් මස 15 දින පස්වරු 2.30 ට ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔවුන් පමණක් එසේ නියුක්ත කරණු ලැබිය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශය තුල සිටින අය අතුරෙනි.

7. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරි විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම් හා කෘෂිකර්ම පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරණ ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කරණ අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වේ.

9. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකම සාධාරණ වූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසි වලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ විය යුතුය.

10. කොන්ත්‍රාත්කරු විසින් වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධව ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

11. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම්පතක් මගින් නුවරඑළියේ දිසාපති ගෙන් ලබා ගත හැක.

12. පැහැර හරින්නන්ගේ ලැයිස්තුවේ සඳහන් කොන්ත්‍රාත්කරුවනට මෙම ටෙන්ඩරය සඳහා ඉල්ලුම් කල නොහැකි බව සලකන්න.

වයි. බී. පුස්සෙදෙනිය,
සහකාර දිසාපති,
නුවරඑළියේ දිසාපති වෙනුවට.

1973 ඔක්තෝබර් 16 වෙනි දින,
නුවරඑළියේ දිසාපති කාර්යාලයේ දීය.

10–907—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම්

### රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1973. 11. 08 වැනි දින පෙරවරු 9.30ට කොටුව නො. 2 ගුදමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:

1973. 11. 07 වැනි දින පෙරවරු 10 සිට පස්වරු 2 දක්වා එම බඩු පරීක්ෂාකර බැලිය හැක.

වැඩි මිලට ඉල්ලා ගත් අය මුළු මුදලින් භාගයක් තීන්දු කළ වහාම ගෙවිය යුතුවේ.

මේ වෙන්දේසියට අදාල කොන්දේසි සඳහා කරුණාකර 1954 මැයි මස 28 දින නො. 10,675 ගැසට් පත්‍රය බලන්න.

සී. ජී. මීගොඩ,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය පී. ඕ/විකිණීම්/80/73,
ශ්‍රී ලංකා රේගුව, කොළඹ.

1. 600×15 'ගුඩ් ඉයර්' ටයර් දෙකක්.
2. ගැලුම් එකේ අයි. සී. අයි. සායම් ටින් 5 ක්.
3. බෝල්ට්ස් නට්ස් සහ වොෂර්ස් සෙට් 20 ක්
4. 'ෂොක් ඇබ්සෝබර්' එකක්.
5. වයර් ක්ලිප්ස් 9 ක්.
6. එවොස්ටික් (කැට් කෑපුනු) ටින් 3 ක්.
7. පිත්තල තෙල් පහනක්, 'මර්කස්' 2 ක්.
8. වසිfපර් 1 ක්.
9. තඹ කම්බි රාත්තලක් පමණ.
10. පිත්තල පයිප්ප කෑලි 2 ක්.
11. සායම් ටින් 2 ක්, හිස් සායම් ටින් 1 ක්.
12. සෞඛ්‍ය උපකරන කෑලි 5 ක්.
13. විදුලි පහන් (බල්බ්) 3 ක්.
14. බෝල් රේසර් 1 ක්.
15. මෝටර් රථ උපකරණ කොටස් 7 ක්.
16. තෙල් පුරවනයක්, මුරිච්චි 100 ක්, මඩුෂ්ට 7 ක්, බ්‍රැකට් 6 ක්.
17. ගැලුම් එකේ සුදු ඊයම් සායම් ටින් 1 ක්
18. කපු නූල් 45 ක්.
19. ඖෂධීය එඬරුතෙල් පීප්ප 3 ක්.
20. ග්ලිසරීන් පීප්ප 2 ක්.
21. ගැලුම් එකේ ලක්සෝල් සායම් ටින් 2 ක්.
22. ගැලුම් එකේ ලක්සෝල් සායම් ටින් 2 ක්
23. පිස්ටන් රිංග්ස් (කුඩා) 144 ක්, පිස්ටන් රිංග්ස් (මධ්‍යම) 115 ක්. ඔයිල් රින්ග්ස් 73 ක්.
24. නෝනා මහතුන්ගේ සෙරෙප්පු ජෝඩු 30 ක්, නෝනා මහතුන්ගේ සෙරෙප්පු පහක්.
25. මෝටර් රථවලට රබර් පියුබ් 21 ක්.
26. ඩන්ලොප් රබර් මිශ්‍රණ ටින් හතලිස් දෙකක්, (42).
27. වැනිලා එසන්ස් බෝතල් 90 ක්.
28. බෝල් රේසර්ස් 9 ක්.
29. දැති සණ්නාඩි රාමු 3 ක්, බෝලය සහිත 'ගියර් ලීවර් 3 ක්. වීල් බ්‍රෙසර්ස් 2 ක්, ජැක් කොටස් කෑලි 1 ක් රිෆ්ලෙක්ටර් 1 ක්, ග්‍රීස් ගන් 1ක් (අසම්පූර්ණ).
30. පා-පැදි 1 ක්.
31. හිස් බෝතල 14 ක්.
32. බීඩි එතිමට ගන්නා කොල රාත්තල් 6 ක්.
33. සායම් ටින් 1ක්.
34. ඇනමල් කෝප්ප 97 ක්.
35. කාර්බන් බිලැක් මළු 5 ක්.
36. පදම්කරණ ලද සම් කෑලි 1935 ක්.
37. සිටිසන් මහතුන්ගේ අත් ඔර්ලෝසු 1 ක්.
38. 'ලකී' නෝනා මහතුන්ගේ අත් ඔරලෝසු 1 ක්.
39. 'සන්යෝ' කැසට් රේඩියෝවක්, කොන්ඩෙන්සර් මයික්‍රෆෝනය, පවර්කෝඩ් සහ පටිගත කරන ලද කැසට් 1 ක් සහිතව.
40. මහතුන්ගේ ඔර්ලෝසු පටි 9 ක්.
41. 'නැෂනල් පැනසොනික්' ගුවන් විදුලි යන්ත්‍රයක් (ඩිලුක්ස්).
42. 'නැෂනල් පැනසොනික්' ගුවන් විදුලි යන්ත්‍රයක් (ඩිලුක්ස්).
43. නෝනා මහතුන්ගේ අකුලන කුඩ 2 ක්.
44. රිස්ලා සිගරට් කඩදාසි පැකට් 600 ක්.
45. අපවිත්‍රවුණු කුලිසම් රෙදි යාල $1\frac{1}{4}$ ක්.
46. හිස් ගෝනි 3 ක්.
47. 'එක්රිල්' තරංගපථ 3 නෝ ඒසී/ඩීසී සොලිඩ් ස්ටේට් ගුවන් විදුලි යන්ත්‍ර එකයි.
48. නැෂනල් 432 ඒසී/ඩීසී රේඩියෝ කැසට් 1 ක්.
49. ආයාකුටු දූසිම් 8 ක්.
50. සෝනි 57-942 ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක්.
51. නැෂනල් සොලිඩ් ස්ටේට් 401 එෆ් වේප් රෙකෝඩරයක් ඒ.සී./ඩී.සී.
52. 'කැස්ටල්' මහතුන්ගේ අත් ඔරලෝසු 10 ක් (ක්‍රියා විරහිත).
53. පෑලෝ මැන්ඩල් ලෙට්ටි 12 ක්.
54. ටෙලිෆෝන් කැසට් රෙකෝඩර් 1 ක්.
55. අබලන් වූ නැෂනල් පැනසොනික් ට්‍රාන්සිස්ටර් රේඩියෝ 10 ක්. ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර හැන්ඩ්ල්ස් 13 ක්, ඒපීඅයි. ඔසිලෝමීටරය සහිත ස්පීඩෝමීටර් 4 ක්, සූට් කේසයක්.
56. සුදු පොල්තෙල් බෝතල් 2 ක්.
57. ට්‍රැවලින් ක්ලොක් 1 ක්, ඔර්ලෝසු පටි (ලෝහ) 13 ක්, ඔර්ලෝසු පටි (නයිලෝන්) 40 ක්.
58. ස්ටැන්ඩඩ් තරංග මාලා 3නෝ ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක්.

59. ස්වැන් ඛඩ තරංග මාලා 3නේ ට්‍රාන් සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක්.
60. ස්වැන් ඛඩ තරංග මාලා 3 නේ ට්‍රාන් සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක්.
61. ස්වැන් ඛඩ තරංග මාලා 3නේ ට්‍රාන් සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍ර 1 ක්.
62. 'කැස්වල්' මහතුන්ගේ අත් ඔර්ලෝසු 1ක්.
63. 'කැසවල්' මහතුන්ගේ අත් ඔර්ලෝසු 1 ක්.
64. 'කැස්වල්' මයතුන්ගේ අත් ඔර්ලෝසු 1 ක්.
65. 'කැස්වල්' මහතුන්ගේ අත් ඔර්ලෝසු 1 ක්.
66. එකක් යාර තුනක් වූ කෘතිම සේද රෙදි කැලි 7 ක්.
67. අපවිත්‍ර වූ කෘතිම සේද සාරි 7ක් සූට්කේසයක් සමග.
68. අපවිත්‍ර වූ 'කැෂ්මියර්' සාරි 1 ක්.
69. කෘතිම සේද වෙට්ටි 3 ක්.
70. කෘතිම සේද සාලු 6 ක්.
71. 'සිටිසන්' මහතුන්ගේ අත් ඔර්ලෝසු 1 ක්, මැණික් ගල් 17.
72. පින් පෝල් ඩී වර්ගයේ පාකර් පෑන් 2ක්, සහ කාට්රිජ් එකක්.
73. ක්‍රවුන් වර්ගයේ ට්‍රාන් සිස්ටර් ගුවන් විදුලියන්ත්‍රයක් ඊ—2461392—011272.
74. පාවිච්චි කල සෙරෙප්පු ජෝඩුවක්.
75. ඇල්ඛර සබන් කැලි 3 ක්, ලක්ස් සබන් කැලි 1 ක්.
76. 1973 වර්ෂයේ දින දර්ශනයක්.
77. යට ඇඳුම් කැලි 28 ක්, නෙස්කැෆේ අවු. 8 බෝතල් 2 ක්, ස්පෝර්ට්ස් කමිස 8 ක්, නෙස්කැෆේ අවු. 2 බෝතල් 2 ක්, අත් දිග කමිස 15 ක් වී.ඕ. 5 කොණ්ඩ විලවුන් බෝතල් 3, රෝයල් කොණ්ඩ විලවුන් බෝත්ල 4 ක්, කුෂන් ලැවැන්ඩර් බෝතල 5 ක්, කුෂන් ළමා පවුඩර් ටින් 3 ක්, චූයින් ගම් 50×4 පෙට්ටි 8 ක්, චූයින් ගම 50 පෙට්ටි 1 ක්, තේ හැඳි 24 ක්, බුයිරෝ රිෆිල්ස් 48 ක්, යැන් බෝල් පොයින්ට් පෑන් 22 ක්; ට්‍රැන් ගුලා බෝල් පොයින්ට් පෑන් 63, බයිරෝ බෝල් පොයින්ට් පෑන් 59 ක්.

10–796—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**රඹුක්කන, වාගොල්ල රජයේ ගොවිපලේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රඹුක්කන, වාගොල්ල රජයේ ගොවිපලේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1973 නොවැම්බර් මස 09 දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසි වූ මොහොතේම සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර, වෙන්දේසිය පැවැත්වෙන දින ප. ව. 3.30 ට පෙර සියලුම ගැනුම්කරුවන් විසින් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

3. වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලේඛනයක් මෙම කාර්යාලයේ හා එම ගොවිපලේ දැන්වීම් පුවරුවල ප්‍රසිද්ධ කරනු ලැබේ.

4. මෙම භාණ්ඩ වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර දිනවලදී කාර්යාල වේලාවන් තුළදී ඉහත සඳහන් මධ්‍යස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

පරිපාලන නිලධාරි (ගො.පා.හා.නි.) කොළඹ.

ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, කොළඹ 5,
1973. 10. 06.

10–782—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසිය—මහේස්ත්‍රාත් උසාවිය, හොරණ

පහත සඳහන් භාණ්ඩ 1973 නොවැම්බර් මස 24 වැනි දින ප.ව. 12.30 ට මෙම උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ගැනුම්කරුවන් විසින් මුදලින් ගෙවීම් කළයුතු අතර, එදිනම භාණ්ඩ උසාවි භූමියෙන් ඉවත් කරගත යුතුයි.

| නඩු අංක | භාණ්ඩවල විස්තර |
|---|---|
| 22980 ... | අංක එෆ්.වී. 4238 දරණ හම්බර් පාපැදිය |
| 1863 ... | අංක ඩී. ආර්. 1493 දරණ රැලේ පාපැදිය |
| — ... | අංක ඒ. එච්. 31210 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක ඒ. ඉසඩ්. 3582 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක යූ. ඉසඩ්. 13273 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක සී. එන්. 283 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක බී. ජේ. 67448 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක යූ. ඩී. 6630 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක ඒ. එෆ්. 79166 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක සී. පී. 9081 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක ඩී. ඊ. 5833 දරණ රැලේ පාපැදිය |
| — ... | අංක අයි. ඕ. 6126 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක ඩී. ඊ. 366 දරණ (වර්ගය පැහැදිලි නැත) පාපැදිය |
| — ... | අංක ඊ. ජී. 37734 දරණ (රජ්) පාපැදිය |
| — ... | ඩී. කේ. 75028 දරණ රැලේ පාපැදිය |
| — ... | අංක ඒ. වයි. 65634 දරණ රැලේ පාපැදිය |
| — ... | අංක ඕ. 20395 දරණ හම්බර් පාපැදිය |
| — ... | අංක සී. ජී. 94588 දරණ රැලේ පාපැදිය |
| ජේ.ආර්. 10/66 ... | අංක ඒ. ජී. 4768 දරණ රැලේ පාපැදිය |
| ජේ.ආර්. 10/66 ... | අංක වී. වයි. 52384 රැලේ පාපැදිය |
| 54857 ... | යකඩපොලු එකයි |
| 51651 ... | කැති එකයි |
| 52333 ... | යකඩ පොලු එකයි |
| 54435 ... | යකඩ පොලු එකයි |
| 52110 ... | මන්නා පිහි එකයි |
| 50661 ... | කැති එකයි |
| 54736 ... | යකඩ පොලු එකයි |
| 54540 ... | උදලු එකයි |
| 53518 ... | කැති එකයි |
| 1318 ... | මන්නා පිහි එකයි |
| 54106 ... | ලී ඇඳන් එකයි |
| 53319 ... | කාන්තා අත් ඔරලෝසුවක් |
| 53227 ... | බිත්ති ඔරලෝසු එකයි |
| ජේ.ආර්.267/73... | කුඩා 10ක්, අලවංගු 2ක්, බාල්දි 3ක්, කුඩා උදලු 2ක් බංඩි කියත් 1ක් |
| 5912 ... | බාල්දි එකක් |
| 1849 ... | බාල්දි එකක් |
| 1885 ... | බාල්දි එකක් |
| — ... | බාල්දි එකක් |
| 51275 ... | පැට්රල් ලාම්පු එකයි |
| — ... | පලංචි කියත් එකත් |
| ජේ.ආර්.107/72... | පලංචි කියත් එකක් |
| 8127 ... | පැට්‍රෝ මැක්ස් ලාම්පු එකයි |
| 8123 ... | උදලු එකයි, ගරන වට්ටියක්, ඉල්ලන්කුංු එකක් |
| 8130 ... | උදලු එකයි |
| 8132 ... | උදලු එකයි, ගරන කුඩා එකයි, බාල්දි එකයි |
| 8133 ... | පොඩි කුඩා එකයි |

| | | |
|---|---|---|
| 8134 | ... | උදලු එකයි, ගරන වට්ටි එකයි, පොඩි කුඩා 1යි |
| ඒ.ආර්.302/73 | ... | උණුවතුර බෝතලයක්, පොඩි පිහි එකක්, වීදුරුවක්, පවුන්ටන් පෑන් එකක්, වෙවැල් බෑග් එකක් |
| 49868 | ... | රත්රන් පැහැති බෝඩරය සහිත රෝසපාට සාරියක්, රත්රන් කරාබු කුට්ටම 1යි |
| 2386 | ... | හරස් කියත් එකක් |
| 5043 | ... | ගිනිකූරු කඳන් කෑලි 24 යි |
| ඒ.ආර්.174/72 | ... | මහෝගනී කෑලි 23ක්, දෙල් කඳන් කෑලි 4ක්, ඇල්බීසියා කඳන් කෑලි 4ක් |
| 2386 | ... | ගොඩපර කඳන් 2ක් |
| 4259 | ... | ඉරාපු මිල්ල කෑලි 42ක් |
| 5137 | ... | වැරනියා කෝටු 10,000ක් |
| — | ... | ප්ලාස්ටික් බූලි 8ක් |
| — | ... | කඹ දහර 6ක් |
| — | ... | (දහරවල) වීයුඹ කෑලි 10ක් |
| බී.ආර්.504/72 | ... | මුල්ලු එකක් |
| 6672 | ... | බටදොඹ 2″ × 2″ ඉරාපු ලී පොලු 48ක්, හොර 2″ × 2″ ඉරාපු ලී පොලු 41ක්, හොර 2″ × 2″ ඉරාපු ලී පොලු 152ක්, මිල්ල කම්බි කනු 65ක්. |

ඩබ්ලිව්. ජී. එන්. වීරරත්න,
හොරණ මහෙස්ත්‍රාත්.

1973 ඔක්තෝම්බර් මස 3 වැනි දින,
හොරණ, මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

10–908—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කාර්, වෑන් ආදී රථවාහන 15 ක් පමණ 1973 නොවැම්බර් මස 06 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 ට කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වාහන කාර්යාල වේලාවන් තුළදී ඉහත සඳහන් ස්ථානයේ දී පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විසතර සඳහා රජයේ සැපයීම් අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් විමසන්න.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් 18 දින.
කොළඹ දීය.

10–974—73.10.26 වැනි දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරනා දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. **සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| **ඔක්තෝබර්** | 73.10.05 සිකුරාද | 73.09.28 සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.12 සිකුරාද | 73.10.05 සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.19 සිකුරාද | 73.10.12 සිකුරාද | දහවල් 12.00 |
| | 73.10.26 සිකුරාද | 73.10.19 සිකුරාද | දහවල් 12.00 |
| **නොවැම්බර්** | 73.11.02 සිකුරාද | 73.10.26 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.09 සිකුරාද | 73.11.02 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.16 සිකුරාද | 73.11.09 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.23 සිකුරාද | 73.11.16 සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.30 සිකුරාද | 73.11.23 සිකුරාද | දහවල් 12.00 |
| **දෙසැම්බර්** | 73.12.07 සිකුරාද | 73.11.30 සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.14 සිකුරාද | 73.12.07 සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.21 සිකුරාද | 73.12.14 සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.28 සිකුරාද | 73.12.21 සිකුරාද | දහවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.**